# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1961/4 - 2016 අප්‍රේල් මස 04 වැනි සඳුදා - 2016.04.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### දකුණු පළාතේ පළාත් සභාව

දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය (සංශෝධන) ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ :-

01. මෙම ප්‍රඥප්තිය 2016 අංක ....... දරන දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ආණ්ඩුකාරවරයා විසින් එයට සිය අනුමතය ලබා දිය හැකි යම් දිනයක සිට ක්‍රියාත්මක වන්නේ ය.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

02. මෙම ප්‍රඥප්තියේ මින්මතු "ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ (උ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"(ඌ) කර්මාන්තකරුවන් විසින් සිය කර්මාන්තවල නිෂ්පාදන ප්‍රවර්ධනය සහ දියුණු කිරීම සඳහා පළාත තුළ එම කර්මාන්තකරුවන් විසින් සමිති සහ සංගම් පිහිටුවා ගැනීම දිරිමත් කිරීම ;".

2002 අංක 1 දරන දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය පනතේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

03. ප්‍රඥප්තියේ 6 වන වගන්තිය, එහි (17) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"(18) කර්මාන්තකරුවන් විසින් සිය කර්මාන්තවල නිෂ්පාදන ප්‍රවර්ධනය සහ දියුණු කිරීම සඳහා පළාත තුළ පිහිටුවනු ලබන යම් සමිතියක් හෝ සංගමයක් ලියාපදිංචි කිරීම සහ ඒ සඳහා ලියාපදිංචි කිරීමේ සහතික නිකුත් කිරීම.".

ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

04. මේ ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වූවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

අර්ජුන උදයකාන්ත වේලාරත්න,
ලේකම්,
ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන, පරිසර කටයුතු,
ග්‍රාමීය කර්මාන්ත, විදුලිබල සහ ග්‍රාමීය හා
වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය,
දකුණු පළාත.

2016 මාර්තු මස 28 වැනි දින,
දෙවන මහල, දක්ෂිණපාය,
ලබුදූව ගාල්ල,
ධීවර සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන, පරිසර කටයුතු, ග්‍රාමීය කර්මාන්ත,
විදුලිබල සහ ග්‍රාමීය හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

04 - 755

1A - PG 2912 — 09 (2016/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.